www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ ජනාධිපතිවරනය: අධ්‍යාපනය පිලිබඳ බොරු පොරොන්දු සහ සත්‍ය වාර්තාව

## Sri Lankan presidential election: false promises and the real record on education

**පානිනී විජේසිරිවර්ධන විසිනි**

**2005 ඔක්තෝබර් 26**

එක්සත් ජාතික පක්ෂයේ (එජාප) සහ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) ඉතිහාසය පිලිබඳ කිසිවක් නොදන්නා අයෙකු, නොවැම්බර් 17 වන දින පැවැත්වීමට නියමිත ජනාධිපතිවරනයට එම පක්ෂවලින් ඉදිරිපත් කොට ඇති අපේක්ෂකයින් දෙදෙනා අධ්‍යාපනය සම්බන්ධයෙන් තරගවදින උද්වේගකර ආකාරය හේතුවෙන් මවිතයට පත්විය හැකි ය.

වත්මන් ජනාධිපතිවරනය පැවැත්වෙන්නේ එජාප හා ශ්‍රීලනිප ආන්ඩු විසින් නිදහස් අධ්‍යාපනයට එල්ල කරන ලද ප්‍රහාරයන්හි විනාශකාරී බල පෑම් ගුරුවරුන්, ශිෂ්‍යයන් හා දෙමාපියන් විසින් අත් විඳිමින් සිටින වාතාවරනයක ය. මහජන අතෘප්තිය පුලුල්වන තරමට මැතිවරන පොරොන්දු වඩාත් විශාල සහ ඇදහිය නොහැකි මට්ටම්වලට නගිනු පෙනේ.

එජාප අපේක්ෂක රනිල් වික්‍රමසිංහ බෝලය පෙරලන්නට පටන් ගත්තේ තමා ජනාධිපතිවුවහොත් දිවා ආහාරය ලෙස ''සෑම පාසැල් දරුවෙකුට ම කිරි වීදුරුවක්'' ලබා දෙන බැව් නිවේදනය කරමිනි. දෙවෙනි වීමට නොරිසි ශ්‍රීලනිප අපේක්ෂක මහින්ද රාජපක්ෂ ප්‍රකාශ කලේ කිරි වීදුරුවක් පමනක් නොව බත් පිඟානක් ද ලබා දෙන බවයි. කොලඹ අගනුවර වටා ප්‍රසිද්ධ මංසන්ධිවල, දරුවන් කෙරෙහි රාජපක්ෂගේ ත්‍යාගශීලීභාවය ප්‍රදර්ශනය කරමින්, ඔහු ''සියලු දරුවන්ගේ මාමා'' ලෙස චිත්‍රනය කෙරෙන දැවැන්ත පුවරු එසැවී පවතී.

අගමැති රාජපක්ෂට එරෙහිව බාල ලකුනු ලබා ගැනීමේ උත්සාහයක යෙදෙමින් විපක්ෂ නායක රනිල් වික්‍රමසිංහ තම මැතිවරන ප්‍රකාශයෙහි නිදහස් අධ්‍යානයෙහි තත්වය ගර්භාවට ලක් කරමින් මෙසේ කියයිඃ ''අද දවසේ යහපත් අධ්‍යාපනයක් ලබා ගැනීම යුද්ධයක්. බොහෝ දෙමාපියන්ට තම දරුවන් 'හොඳ'පාසලකට ඇතුලු කර ගැනීම දිනන්න බැරි අරගලයක් වෙලා. උසස් පාසැල් අතලොස්සට දරුවන් ඇතුලු කර ගන්න හැකි වෙලා තිබෙන්නෙ යමක් කමක් තිබෙන නාගරිකයන්ට පමනයි''.

මෙම ප්‍රකාශය හුදෙක් වික්‍රමසිංහට මෙන්ම රාජපක්ෂටද එරෙහි බලගතු දෝෂාභියෝගයකට වැඩි යමක් නො වේ. 1948හි නිදහසේ සිට ශ්‍රී ලංකාව පාලනය කලේ එකකට පසු එකක් බලයට පැමිනි එජාප සහ ශ්‍රීලනිප ආන්ඩු විසිනි. 2001 සිට 2004 දක්වා ආන්ඩු කලේ වික්‍රමසිංහ සහ එජාපය යි. එහි ආර්ථික ප්‍රතිව්‍යුහකරන වැඩපිලිවෙලට එරෙහි විරෝධය හේතුවෙන් 2004 මහ මැතිවරනයෙන් එජාපෙට විශාල පරාජයක් අත්විනි. මෙම පක්ෂ දෙකම පසු ගිය දශක තුන පුරා නිදහස් අධ්‍යාපනය විනාශ කිරීම සම්බන්ධයෙන් වග කිව යුතු ය.

1940 ගනන් සහ 1950 ගනන්වල දී නිදහස් අධ්‍යාපනය පුලුල්ව ස්ථාපිත කෙරුනේ එවකට ට්‍රොට්ස්කිවාදී පක්ෂයක්වූ ලංකා සම සමාජ පක්ෂයේ (ලසසප) නායකත්වයෙන් කම්කරු පන්තිය ගෙන යන ලද අරගලයට ප්‍රතිචාරයක් ලෙසිනි. ඔවුන්ගේ එම ඉල්ලීම් අතර සියලු ජනයාට නිදහසේ අධ්‍යාපනය ලැබිය හැකි රජයේ පාසැල් පද්ධතියක් ස්ථාපිත කිරීමේ ඉල්ලීම විය.

එම උද්ඝෝෂනයන්හි ප්‍රතිඵල ලෙස සහන ගනනාවක් දිනාගත හැකි විය. අධ්‍යාපනය සඳහා 1950 දී රජයෙන් වියදම් කල මුදල දල ජාතික නිෂ්පාදනයෙන් සියයට 2.5ක් වූ අතර අරගලයේ ප්‍රතිඵලයක් ලෙස 1960 වන විට එම අගය සියයට 4.0 දක්වා ඉහල නැංවිනි.

කෙසේ නමුත්, 1970 අගභාගයේ සිට ''විවෘත වෙලඳපොල'' පිලිවෙත්වලට හැරී ගැනීමේ කොටසක් ලෙස නොකඩවා එල්ල කෙරුනු ප්‍රහාරයකට නිදහස් අධ්‍යාපනය යටත් විය. 1977 දී බලයට පැමිනි එජාප ආන්ඩුවේ අධ්‍යාපන ඇමතිවරයා ලෙස වික්‍රමසිංහ මෙම ප්‍රහාරයන්ට සෘජුවම වගකිව යුතු ය. සමස්ත සංඛ්‍යා ලේඛන මගින් ප්‍රහාරයේ ස්වභාවය පැහැදිලි කෙරේ. දල ජාතික නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් ලෙස 1984 දී අධ්‍යාපනයට වැය කල මුදල සියයට 3.0ක් වූ අතර 2004 දී එම අගය සියයට 2.09 දක්වා කපා හැරිනි. සමස්තයක් ලෙස ගත් කල දකුනු ආසියාවේ අධ්‍යාපන

වියදම දල ජාතික නිෂ්පාදිතයෙන් සියයට 3.2ක් වන අතර ආදර්ශ ශුභසාධන රාජ්‍යයක් ලෙස සැලකෙන ශ්‍රී ලංකාවේ එම අගය සංසන්දනාත්මකව ඉතා පහල අගයක පවතී.

1981 දී, *අධ්‍යාපන ධවල පත්‍රිකාව* මගින් නිදහස් අධ්‍යාපනය තලා දැමීමේ තම සැලසුම් එජාප ආණ්ඩුව විසින් එලිදරව් කල අතර මෙම ධවල පත්‍රිකාව ලෝක බැංකුවේ සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ බලගතු පීඩනය යටතේ සැලසුම් කෙරින. ''අයෝග්‍ය'' පාසැල් වසා දැමීමේ මග සලසමින් පාසැල් ''වර්ගීකරනය'' එම යෝජනා අතර විය. ''කලමනාකාරිත්ව ස්වෛරීභාවය''ක් පවරාදීමේ නාමයෙන්, පාසැල් පවත්වාගෙනයාමේ බර ගුරුවරුන්ට හා දෙමාපියන්ට පැටවීමේ අරමුනෙන් ''පාසල් සංවර්ධන මන්ඩල'' පිහිටුවීමට සැලසුම් නිර්මානය කෙරින.

කම්කරුවන්ගේ, ශිෂ්‍යයන්ගේ සහ ගුරුවරුන්ගේ පුලුල් විරෝධය හේතුවෙන් සැලසුම කොටසින් කොටස ක්‍රියාත්මක කිරීම සඳහා පමනක් එය පසෙක තැබී ය. 1980 ගනන්වල දී, ''මේ අපේ පාසැලයි'' යන පාඨය යටතේ ගොඩනැගිලි, ලී බඩු සහ ක්‍රීඩා පිටි පවත්වා ගෙන යාමේ වියදම් දෙමාපියන්ගේ ''වගකීමක්'' ලෙස ක්‍රමානුකූලව පැවරින.

සමෘද්ධිමත් ප්‍රදේශවල පිහිටි පාසල් කිහිපයක් පමනක් මෙහි වාසි අත් විඳි අතර අතිමහත් බහුතරයේ තත්වයන් පරිහානියට පත් විය. ධනවතුන්ගේ සහ දුප්පතුන්ගේ දරුවන් අතර වැඩෙන අධ්‍යාපනික අසමානතාව තීව්‍ර කරමින්, පාසල් වර්ගීකරනය කෙරෙන පද්ධතියක් යටතේ, වරප්‍රසාදිත පාසල් 52ක් පමනක් ''වඩාත් ජනප්‍රිය'' විය.

එජාප ආණ්ඩුව නේවාසික ගුරු පුහුනු විදුහල් වසා දමා, වියදම් කපා දැමීමේ පියවරක් ලෙස, ''දුරස්ථ ගුරු පුහුනු මධ්‍යස්ථාන'' ආරම්භ කලේ ය. එමෙන්ම ප්‍රථම ගාස්තු අය කෙරෙන විශ්ව විද්‍යාලය -- රාගම වෛද්‍ය විද්‍යාලය -- ආරම්භ කෙරින.

## පොදු පෙරමුනු ආණ්ඩුව

වසර 17ක එජාප පාලනයෙන් පසු, රටේ සිවිල් යුද්ධය අවසන් කිරීමට, ප්‍රජාතන්ත්‍රීය අයිතීන් යලි ස්ථාපිත කිරීමට සහ නිදහස් අධ්‍යාපනය ඇතුලු ජීවන කොන්දේසි වර්ධනය කිරීමට පොරොන්දු දෙමින් 1994 දී බලයට පැමිනි ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග සහ ඇගේ ශ්‍රීලනිපය නායකත්වය දුන් පොදු පෙරමුනු ආණ්ඩුව කෙරෙහි ඡන්දදායකයෝ ඉහල බලාපොරොත්තු තැබූහ.

මෙම බලාපොරොත්තු සැනෙන් සුනු විසුනු විය. රාජපක්ෂ කැබිනට් ඇමතිවරයෙකු වූ පොදු පෙරමුනු ආණ්ඩුව ලෝක බැංකුව සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල විසින් ඉල්ලුම් කෙරුනු ''වෙලඳ පොල ප්‍රතිසංස්කරන'' න්‍යාය පත්‍රය ක්‍රියාවට දැමූ අතර එය පක්ෂ දෙකෙහිම සුරක්ෂිත වැඩපිලිවෙල බවට පත් විය. පොදු පෙරමුනු ආණ්ඩුව රජයේ පාසල් වසා දැමීම ආරම්භ කරමින් පුද්ගලික පාසල් ආරම්භ කිරීම දිරිමත් කල අතර 2001න් පසු එජාප ආණ්ඩුව එම පිලිවෙත් නොකඩවා ඉදිරියට ගෙන ගියේ ය. ''වර්ගීකරනය'' යටතේ 1997 සිට 2004 දක්වා රජයේ පාසල් 592ක් වසා දැමුනු අතර පුද්ගලික පාසල් ප්‍රමානය 125කින් ඉහල නැගින.

පසු ගිය දශක තුන තුල, අධ්‍යාපනය සඳහා වියදම් බර දෙමාපියන්ගේ සහ ශිෂ්‍යයන්ගේ කර මතට වඩ වඩාත් පැටවින. සැප්තැම්බරයේ නිකුත්වූ මෑත ම මහ බැංකු සමීක්ෂනයකට අනුව පුද්ගලික පන්තිවලට සහභාගි වන සිසුන් සංඛ්‍යාවේ ප්‍රතිශතය 1996/97 වසරේ හි අගය වන 35 සිට 2003/04 වසරේ අගය 49.6 දක්වා ඉහල නැග ඇත.

ලොක බැංකු වාර්තාවකට අනුව රටේ මුලු අධ්‍යාපන වියදමෙන් සියයට 21ක් තරම් ඉහල අගයක් දරනුයේ ගෘහස්ථ වියදම් ලෙසිනි. එමගින් පොහොසතුන් සහ දුප්පතුන් අතර පරතරය දැවැන්ත බව ද අනාවරනය කෙරේ. අධ්‍යාපනය සඳහා වන සමස්ත ගෘහමය වියදමෙන් සියයට 52ක් ම පොහොසත්ම සියයට 20 දරන අතර දුප්පත්ම සියයට 20 දරන්නේ සියයට 6ක් වැනි කුඩා අගයකි.

වත්මන් ශ්‍රීලනිප නායකත්වයයෙන් යුත් ආණ්ඩුව, නියාමක පදනම යටතේ පාසල් 200ක පාසල් පාදක කලමනාකරනය ක්‍රියාත්මක කරමින් පවතී. ''කලමනාකාරිත්ව ස්වෛරීභාවය'' පවරාදීමේ නාමයෙන් එකී පාසල්වලට සම්පත් සපයා ගැනීම, උගැන්වීමේ උපකරන තෝරා ගැනීම, අය-වැය අනුමත කිරීම සහ උපදේශක සේවාවන් මිලට ගැනීම වැනි කාර්යයන්හි වගකීම් පැවරේ.

පාසැල් පාදකව ගුරුවරුන් කුලියට ගැනීමේ පිලිවෙත යටතේ මධ්‍යගතව ගුරුවරුන් සැපයීමේ ක්‍රමය වනසා දැමීමට නියමිත ය. අනිවාර්යයෙන්ම මෙම පිලිවෙත වෙනස්කම් වැඩි කිරීමට ද ගුරුවරුන්ගේ අයිතීන් සහ සේවා කොන්දේසි වලලා දැමීමට ද තුඩු දෙනු ඇත. රාජපක්ෂ සහ ඔහුගේ ආණ්ඩුව මෙම යෝජනාවලට සහාය දෙමින් සිටින අතර වික්‍රමසිංහ ද එයට පිටුබලය ලබා දෙන බවට තම මැතිවරන ප්‍රකාශයෙහි සඳහන් කොට ඇත.

විශ්වවිද්‍යාල අධ්‍යාපනයද දැඩි ප්‍රහාරයකට ලක් වෙමින් පවතී. වසරක් තුල විශ්ව විද්‍යාල පද්ධතියට ඇතුලු කර ගත හැක්කේ සිසුන් 16,500ක් පමනක් බැවින් සුදුසුකම් ලබන 90,000ක් පමන සිසුන්ට සෑම වසරක් පාසාම එම වරම් අහිමි වේ. ඒ අතරින් අතමිට ඇති අය විදේශීය විශ්ව විද්‍යාලවලට අනුබද්ධ උපාධි ප්‍රදානය කිරීමේ පුද්ගලික ආයතනවලට ඇතුලු වෙති. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ අධ්‍යනයකට අනුව මෙම

''ලාභදායී ව්‍යාපාරයෙහි'' යෙදී සිටින සමාගම් 50ක් පමන වේ.

සමස්ත ජනගහනයෙන් සියයට 44ක් ම දෛනික ආදායම රුපියල් 200ට ද සියයට 26ක දෛනික ආදායම රුපියල් 100ට ද අඩු වන රටක බොහොමයක් තරුන ජනයාට මෙම පුද්ගලික විශ්ව විද්‍යාල අධ්‍යාපනය සිහිනයක් පමනි. උදාහරනයක් ලෙස ලංකා තොරතුරු තාක්ෂනවේද ආයතනය (එස්එල්අයිඅයිටී) විසින් පවත්වා ගෙන යනු ලබන තුන් අවුරුදු උපාධි පාඨමාලාව සඳහා රුපියල් 450,000ක ඉතා අධික මුදලක් අය කෙරේ. මීට අමතරව ගම්බද පලාත්වලින් පැමිනෙන සිසුන්ට අධික නේවාසික ගාස්තුවක් ද දැරීමට සිදු වේ.

එජාප හා ශ්‍රීලනිප නායකත්වයෙන් යුත් සෑම ආන්ඩුවක් ම අන් සෑම ක්ෂේත්‍රයකදී මෙන්ම අධ්‍යාපනයේදී ද දෙමල සුලුතර ජනවර්ගයට එරෙහිව එක දිගටම වෙනස්කම් කලහ. දිවයිනේ විසි අවුරුදු යුද්ධයෙන් විනාශයට පත් උතුරු සහ නැගෙනහිර අධ්‍යාපනය පුනරුත්ථාපනය කිරීම සඳහා අවශ්‍ය කෙරී ඇති මුදල් නො සැපයීම මගින් මෙය පැහැදිලිවම අනාවරනය වේ. මෙම ප්‍රදේශයන්හි ''අධ්‍යාපන ප්‍රතිනිර්මානය සහ පුනරුත්ථාපනය'' සඳහා තක්සේරු කෙරී ඇති අවම මුදල වන එක්සත් ජනපද ඩොලර් මිලියන 164න් මෙතෙක් වෙන් කොට ඇත්තේ මිලියන 5ක සොච්චමක් පමනි. මධ්‍යම කඳුකරයේ දෙමල කතා කරන වතු කම්කරු දරුවන්ගෙන් සියයට 20ක් කවර හෝ පාසල් අධ්‍යාපනයක් නොලබන අතර සියයට 44ක් ලබනුයේ ප්‍රාථමික අධ්‍යාපනය පමනකි.

ජනාධිපතිවරනයෙන් පසු නිදහස් අධ්‍යාපනය සම්බන්ධයෙන් කෙරෙන දෑ රාජපක්ෂගේ සහ වික්‍රමසිංහගේ හිස් පොරොන්දුවලින් නිර්නය නො වේ. වසර මුලදී නිකුත් කෙරුනු ''සංවර්ධන පිලිවෙත් විමසුම'' නම් වූ ලෝක බැංකු වාර්තාවෙන් මේ වන විටත් නියාමන රේඛා සපයා ඇත. කුඩා පාසල් වසා දමන ලෙසටත්, සමස්ත ගුරු සංඛ්‍යාව අඩු කරන ලෙසටත්, අධ්‍යාපන කාර්යාලවල, පුහුනු සහ සම්පත් මධ්‍යස්ථානවල පරිපාලන කාර්ය මන්ඩල කපා හරින ලෙසටත් ලෝක බැංකුව ආන්ඩුවට අවධාරනය කරයි.

ලෝක බැංකු තක්සේරුවලට අනුව, සමස්ත පාසැල් සංඛ්‍යාවෙන් සියයට 60ක, එසේත් නොමැති නම් පාසැල් 6000ක්, සිසු-ගුරු අනුපාතය 15:1ක් වන අතර එය අධික වියදම් දරන්නකි. ''ශ්‍රී ලංකාවේ අධ්‍යාපන පද්ධතියේ නිධානයන්''නම් වූ වාර්තාව කියා සිටින්නේ සිසු-ගුරු අනුපාතය 25:1ක් වන සුවිසල් පාසල් හා සසඳන කල මෙම කුඩා පාසල්වල ඒකක වියදම සියයට සියයක් විශාල බවයි. මෙහි නිසැක නිගමනය නම් සිය ගනනක්, දහස් ගනනක් නොවේ නම්, කුඩා පාසල් ඒකාබද්ධ කිරීමට හෝ මුලුමනින්ම වසා දැමීමට නිශ්චිත බවයි.

විශ්ව විද්‍යාල සිසුන් සඳහා වන වත්මන් ''මහපොල ආධාර'' ක්‍රමය වෙනුවට ''ශිෂ්‍ය වවුචර සහ ශිෂ්‍ය නය'' ක්‍රමයක් ස්ථාපිත කල යුතු බවට ඉහත වාර්තාව යෝජනා කරයි. දැනට රජයේ විශ්ව විද්‍යාලයන්හි අධ්‍යාපනය ලබන සිසුන්ට මාසිකව රුපියල් 2000ක මහපොල ආධාර ලැබෙමින් පවතී. වාර්තාවේ යෝජනාව ක්‍රියාත්මක වුවහොත් සිසුන් සුවිසල් නය බරින් මිරිකෙනු නියත ය.

පුද්ගලික විශ්ව විද්‍යාල ප්‍රසාරනය කිරීමේ සැලැසුම් දැනටමත් ක්‍රියාත්මකය. මැයි මාසයේ පැවැත්වුනු නැගෙනහිර විශ්ව විද්‍යාලයේ උපාධි ප්‍රදානෝත්සවය අමතමින් ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග කියා සිටියේ විශ්ව විද්‍යාල අධ්‍යාපනය තුල ''බලගතු වෙනස්කම්'' සිදු කල යුතු බව යි. ''මෙහි පීඨයන් විවෘත කිරීම සඳහා විදේශීය විශ්ව විද්‍යාල දිරිගැන්වීමෙන්'' ආන්ඩුව වලක්වන අයට ඇය පහර දුන්නා ය.

ශිෂ්‍යයන්ගෙන් අතිමහත් බහුතරය යැපී සිටින නිදහස් අධ්‍යාපන පද්ධතියට එල්ල කෙරෙන ප්‍රහාරයන් තවත් ගැඹුරු කිරීම හැර රාජපක්ෂගෙන් හෝ වික්‍රමසිංහගෙන් බලාපොරොත්තු විය හැකි කිසිවක් කම්කරු පන්තියට නොමැත. මෙම දිග් ගැසුනු ප්‍රහාරය නවතා ලීම සඳහා, ආපසු හැරවීම පසෙක තබමු, කම්කරු පන්තියේ සමාජ ස්ථානය රැක ගැනීම සඳහා වන පුලුල් ව්‍යාපාරයක කොටසක් ලෙස ගුරුවරුන්, සිසුන් සහ දෙමාපියන් බලමුලුගන්වා ගැනීම ආවශ්‍යක කෙරේ. එජාපයට සහ ශ්‍රීලනිපයට නිදහස් ඉහල ගුනාත්මකභාවයෙන් යුත් අධ්‍යාපනයක් සැපැයිය නොහැකි නම් සමාජවාදී පිලිවෙත් මත පදනම්වූ කම්කරුවන්ගේ හා ගොවියන්ගේ ආන්ඩුවකින් එය විස්ථාපනය කල යුතු වේ.

සමාජවාදී සමානතා පක්ෂයේ අපේක්ෂක විජේ ඩයස් මෙම ජනාධිපතිවරනයට ඉදිරිපත් වී සිටින්නේ කම්කරු පන්තිය සඳහා සමාජවාදී ක්‍රියා මාර්ගයක් සහ ඉදිරි දර්ශනයක් ඉදිරිපත් කිරීමට ය. විශ්ව විද්‍යාලීය අධ්‍යාපනය තෙක් වන නිදහස් සහ ඉහල ගුනාත්මකභාවයෙන් යුත් අධ්‍යාපනය සියලු දරුවන්ගේ මූලික අයිතියකි. තරුන ජනයාගේ හැකියා සහ නිපුනතා වර්ධනය කර ගැනීම සඳහා ඔවුනට විද්‍යාත්මක පර්යේෂනාගාරයන්, පරිගනක පහසුකම් සහ නූතන ශ්‍රව්‍ය-දෘශ්‍ය අධ්‍යාපනික තාක්ෂනයන් මෙන් ම ක්‍රීඩා සහ කලා පහසුකම් ද ලබා දිය යුතු ය. සමස්ත සමාජය ඉහල සිට පහලට සමාජවාදී පරිවර්තනයකට ලක් කිරීම හැර ඊට අඩු දෙයක් අරමුනු කර නොගත් අපේ ක්‍රියා මාර්ගය අධ්‍යනය කරන ලෙසත්, අපේ උද්ඝෝෂනයට ක්‍රියාකාරීව සහයෝගය දෙන ලෙසත් සසප කම්කරුවන්ගෙන්, ගුරුවරුන්ගෙන් සහ විශේෂයෙන්ම තරුන ජනයාගෙන් ඉල්ලා සිටී.

© www.wsws.org